නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා ෂජරා මාර්ගය ඔස්සේ පිටත් වන්නෙකු ලෙසත් මඃරස් මාර්ගය ඔස්සේ ඇතුළු වන්නෙකු ලෙසත් සිටියහ. එතුමා මක්කාවට පිවිසුනු විට ඉහළ සනිය්යාවෙන් ඇතුළු වූ අතර පහළ සනිය්යාවෙන් පිටත් වූහ.

අබ්දුල්ලාහ් ඉබ්නු උමර් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් වාර්තා කරන ලදී. “නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා ෂජරා මාර්ගය ඔස්සේ පිටත් වන්නෙකු ලෙසත් මඃරස් මාර්ගය ඔස්සේ ඇතුළු වන්නෙකු ලෙසත් සිටියහ. එතුමා
මක්කාවට පිවිසුනු විට ඉහළ සනිය්යාවෙන් ඇතුළු වූ අතර පහළ සනිය්යාවෙන් පිටත් වූහ.“
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

අවුරුදු දින ජුමුආ දින හා වෙනත් නැමදුම් සඳහා යන එන විට මඟ වෙනස් කිරීමේ වැදගත්කම යන මාතෘකාව යටතේ අබ්දුල්ලාහ් ඉබ්නු උමර්-රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කළ හදීසය සඳහන්ව ඇත. යන එන මඟ වෙනස් කිරීම යනු: නැමදුම් සඳහා මුස්ලිම්වරයකු එක් මාර්ගයකින් පිටත්ව ගොස් තවත් මාර්ගයකින් හැරී ඒමය. උදාහරණයක් වශයෙන් දකුණු පැත්තෙන් ගියේ නම් වම් පැත්තෙන් නැවත හැරී පැමිණීම මෙනි. මෙසේ අවුරුදු දෙදින සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා සිදු කර ඇති බවට හදීස් සඳහන් වේ. ජාබිර් -රළියල්ලාහු අන්හු තුමා මෙසේ පවසා සිටියි. නබි- සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමාණෝ අවුරුදු දින වූ විට මඟ වෙනස් කළහ. එනම් එක් මාර්ගයකින් පිටත්ව ගොස් තවත් මාර්ගයකින් හැරී ආහ. අප සමග ඇති හදීසයේ සඳහන්ව ඇත්තේත් එලෙසය. මාර්ගය වෙනස් කිරීමේ ඇති යථාර්ථයන් පිළිබඳ විද්වතුන් අතර විවිධ ප්රකාශයන් ඇත. ඒවායින් වඩාත් ප්රසිද්ධ ප්රකාශයන් වනුයේ. 1. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ එම මාර්ග දෙක සාක්ෂි දැරීම හේතුවෙනි. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඒ මත සිදු කළ හොඳ නරක සියල්ල වෙනුවෙන් එය සාක්ෂි දරනු ඇත. මාර්ගයකින් ගොස් තවත් මාර්ගයකින් පැමිණි විට තමන් අවුරුදු සලාතය ඉටු කර ඇතැයි යන්නට මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ එම මාර්ග දෙක සාක්ෂි දරනු ඇත. 2. ආගමික සංඛේතයන් හෙළිදක්වනු පිණිසය. උත්සවයේ සංඛේතය එහා මෙහා කඩසාප්පු පිරී තිබීමය. මදීනා මාර්ගයේ පිරී පවතින විට එය එම උත්සවය සංකේතවත් කරනු ඇත. හේතුව අවුරුදු සලාතය යනු ආගමික සංඛේතයකි. ඒ සඳහා වූ සාක්ෂිය වනුයේ, අවුරදු දින සතුට හෙළි දැක්වීමක් වශයෙන් හා එය දැනුම්දීමක් වශයෙන් එළිමහන් ප්රදේශය වෙත පිටත්ව යාමට මිනිසුනට නියෝග කරනු ලැබ තිබීමයි. 3. සැබැවින්ම එසේ ගමන් මාර්ගය වෙනස් කරනුයේ කඩසාප්පු අසළ සිටි දුගියන් හේතුවෙනි. එක් මාර්ගයක සිටින අය තවත් මාර්ගයක නොසිටිති එවිට ඔවුන්ටත් මොවුන්ටත් දානමාන කිරීමේ අවස්ථාව උදාවනු ඇත. නමුත් වඩාත් සමීප අර්ථය වනුයේ ගමේ පිහිටා ඇති සියලු මාර්ගවලින් ජනයා අවුරුදු සලාතය වෙත පැමිණ සලාතය ඉටු කිරීමේ සළකුණ ඉස්මතු වන අයුරින් සංඛේතවත් කරනු පිණිසය. හජ් උත්සවය වනාහි, අප සතුව ඇති හදීස්හි සඳහන් පරිදි සැබැවින්ම දූතයාණන් සල්ලල්ලාහු අලය්හි වසල්ලම් මක්කාව වෙත ඇතුළු වන විට එහි ඉහළ ප්රදේශයෙන් ඇතුළු වූ අතර එහි පහළ ප්රදේශයෙන් පිටත් වූහ. එතුමා අරෆා වෙත ගිය විටත් මාර්ගයකින් ගොස් තවත් මාර්ගයකින් හැරී ආහ. මෙම ප්රශ්නය සම්බන්ධයෙන් විද්වතුන් අතර මතභේද පවතී. එය නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා සිදු කර ඇත්තේ

නැමදුම් කිරීමේ ක්රියාවලිය අනුවද එසේ නැතිනම් මක්කාවට පිවිසීමේ හා පිටත් වීමේ පහසුව අනුවද? යන්නයි. හේතුව එහි පිවිසීමේදී ඉහළ ප්රදේශයෙන් පිවිසීමත් ඉන් පිටත් වීමේදී පහළ ප්රදේශයෙන් පිටවීමත් පහසු වූ බැවිනි. පළමු මතය දරන විද්වතුන් ඇතැමෙකු පවසා සිටිනුයේ සැබැවින්ම එසේ එහි ඉහළ ප්රදේශයෙන් ඇතුළු වීමත්. එනම් මක්කාවට ඉහළ ප්රදේශයෙන් ඇතුළු වීමත් එහි පහළ ප්රදේශයෙන් පිට වීමත් සුන්නාවක් යන වගය. එමෙන්ම එක් මාර්ගයකින් අරෆාවට පැමිණීමත් තවත් මාර්ගයකින් හැරීයාමත් සුන්නාවක් යන වගය. ඔවුන් අතුරින් තවත් සමහරු ගමන්කිරීමේ පහසුව පිණිස සිදු කළ බව අදහස් පළ කරති. එය ඉහළ ප්රදේශය වුවද පහළ ප්රදේශය වුවද පහසු ප්රදේශයෙන් ගමන් කරන්න යනුවෙනි. ඒ අනුව හජ් හෝ උම්රා වන්දනා කරුවාට එහි ඉහළ ප්රදේශයෙන් ඇතුළු වීමටත් එහි පහළ ප්රදේශයෙන් පිට වීමටත් පහසු නම් එය යහපත්ය. එවිට එය නැමදුමක් වී නම් එහි ඵලය ඔහු ලබනු ඇත. එය නැමදුමක් නොවී නම් එය ඔහුට හානියක් නැත. එසේ පිවිසීමට පහසුතාවක් නොමැති නම් ඒ සඳහා වෙහෙස දැරිය යුතු නැත. එය වර්තමානයේ ඇති තත්ත්වය හා සමානය. සැබැවින්ම වර්තමානයේ ඇති මාර්ග එකම දිශාවකට පිහිටා තිබේ. මෙවැනි අවස්ථාවක කටයුතු භාරව සිටින්නාට විරුද්ධව කටයුතු කිරීම මිනිසාට සුදුසු කාර්යයක් නොවේ. සියලු ප්රශංසා අල්ලාහ්ටමය. මෙම කරුණ ඉතා පුළුල් වූවකි.

http://www.sunnah.global/hadeeth/si/show/3040